museum of modern
and contemporary art
sri lanka

PRESS RELEASE

2023 පෙබරවාරි

## ශ්‍රී ලංකා නූතන හා සමකාලීන කලා කෞතුකාගාරයේ 'මුණගැසීම්' නිමාවෙයි

ශ්‍රී ලංකා නූතන හා සමකාලීන කලා කෞතුකාගාරය (MMCA ශ්‍රී ලංකා) විසින් අභිරක්ෂණයකළ ‘මුණගැසීම්’, මාර්තු 19 දින කොළඹ 3, ක්‍රෙස්කැට් බුලෙවාඩ්හි බිම් මහලේ පිහිටි එහි පරිශ්‍රයේදී අවසන්විය. 2022 පෙබරවාරි 10 විවෘතවුණු මෙම ප්‍රදර්ශනය, දිවයිනේ සහ බර්ලිනයේ වෙසෙන කලාකරුවන් 15 දෙනෙකුගේ කලාකෘති 59 ඉදිරිපත්කළේ ය.

‘මුණගැසීම්හි’ සෑම සංදර්ශකයක් ම ජෝන් කීල්ස් සමූහ ව්‍යාපාරයේ හෝ ජෝර්ජ් කීට් පදනමේ එකතුවලින් විශේෂයෙන් තෝරාගත් සිතුවමක් වටා දිවෙමින් එයට ප්‍රතිචාර දැක්වූයේ ය. අබ්දුල් හාලික් අසීස් (b. 1985), ඕබ්‍රි කොලෙට් (1920–1992), මාර්ටින් වික්‍රමසිංහ (1890–1976), සේනක සේනානායක (b. 1951), ජෝර්ජ් කීට් (1901–1993), ප්‍රදීප් තලවත්ත (b. 1979), අසායි රාසයියා (1946–2020), අප්‍රිකානු-ආසියානු ලේඛකයන්ගේ කාර්යංශය, අප්‍රිකානු-ආසියානු ලේඛක ස්ථිර කාර්යංශය, රිචඩ් ගේබ්‍රියල් (1924–2016), සුසිමන් නිර්මලවාසන් (b. 1982), ෆිරි රහ්මාන් (b. 1990), ගාමිණී රත්නවීර (b. 1949), ඉස්මත් රහීම් (b. 1941), ඒ. මාර්ක් (1933–2000), නෙලුන් හරස්ගම (b. 1959), හා ජනනි කුරේ (b. 1974) විසින් කළ 1950 දශකයේ සිට වර්තමානය දක්වාවූ සිතුවම්, චිත්‍ර, අභිවහන, ස්ථාපන, හා ඡායාරූප ප්‍රදර්ශනයේ ඇතුළත් විය.

‘මුණගැසීම්' පිළිබඳ අදහස් දක්වමින් MMCA ශ්‍රී ලංකාහි ප්‍රධාන අභිරක්ෂක ශාර්මිණී පෙරේයිරා සඳහන්කළේ, “අන්තර්ගතය වෙනස් නොකර කුඩා ප්‍රදර්ශන අවකාශයක අපට කළ හැකි දේ සංදර්ශක වටමාරු හරහා අපි ඉදිරපත්කළා. සංදර්ශක හයෙන් සෑම එකක් ම විවිධ නරඹන්නන් කණ්ඩායම් උදෙසා පුළුල් පරාසයකින් යුත් විෂය කරුණු සැපයුවා” යනුවෙණි. ඇය තවදුරත් පැවසුවේ, “‘මුණගැසීම්’ පිටුපස තිබූ අත්‍යාවශ්‍යතාව වූයේ නූතන හා සමකාලීන දෑ එක්ව දැකිය හැකි ආකාර පෙන්වීමත්, එමගින් පර්යේෂණ පදනම්කරගත් අභිරක්ෂක සංදර්ශක සහ ප්‍රදර්ශන සැලසුම් නිර්මාණකරණ හරහා, හුරුපුරුදු සහ නොහුරු දේ ගැන නව ප්‍රශ්න මතුකරන දෘෂ්ටි කෝණ ගෙනෙන අයුරු පෙන්වාදීමත්” කියා ය.

Groundfloor, Crescat Boulevard
89 Galle Road
Colombo 03

Registered Address:
117 Sir Chittampalam A. Gardiner Mawatha
Colombo 02
Sri Lanka

info@mmca-srilanka.org
www.mmca-srilanka.org

'මුණගැසීම්හි' ප්‍රදර්ශනයවූ කලාකෘති නැරඹීමට හා කෞතුකාගාරයේ පොදු වැඩසටහන්වලට නොමිලේ සහභාගීවීමට 20,000 අධික පිරිසක් පැමිණියහ. එමෙන් ම, ගැලරි කතා 20, වැඩමුළු 30, අභිරක්ෂක සංචාර 30, MMCA ශ්‍රී ලංකාහි ප්‍රථම කවි සමාජයේ සැසි 3, කවි කියවීම් 4, බාහිර අධ්‍යාපනඥයින් හා කෞතුකාගාර ආශ්‍රිතයින් මෙහෙයවූ ප්‍රදර්ශන සංචාර 10, සහ ප්‍රහේලිකා දින, ප්‍රසංග, හා චිත්‍රපට තිරගතකිරීම් වැනි විශේෂ වැඩසටහන් 40 ඇතුළත් නොමිලේ පැවැත්වූ පොදු වැඩසටහන් 132 MMCA ශ්‍රී ලංකා සංවිධානයකළේ ය. පාසැල් හා විශ්වවිද්‍යාල සිසුන් 887ක් ද ඇතුළත් කණ්ඩායම් සඳහා තවත් මගපෙන්වූ සංචාර 40 කෞතුකාගාරයේ ව්‍යාප්ති වැඩසටහන් මගින් මෙහෙයවනු ලැබුණි. කාන්‍යා ද අල්මේදා සමඟ සැසි හතරකින් යුත් ලේඛන වැඩමුළුවක් ද 2023 මාර්තු මාසයේ MMCA ශ්‍රී ලංකා විසින් පවත්වන ලදී.

“MMCA ශ්‍රී ලංකාහි අධ්‍යාපන හා පොදු වැඩසටහන්වලට සහායවූ යුරෝපා සංගමය, නේෂන්ස් ට්‍රස්ට් බැංකුව, Foundation for Arts Initiatives, හා ජෝන් කීල්ස් පදනමට අපි ස්තුතිවන්ත වෙනවා,” කියමින් පෙරේයිරා තවදුරටත් පැවසුවේ, “රටේ ස්ථිර නූතන හා සමකාලීන කලා කෞතුකාගාරයක් ගොඩනැගීමට අවශ්‍ය මනා දෘශ්‍යතාව හා සහයෝගය අප වර්ධනයකරන අතරේ, කෞතුකාගාරයේ ක්‍රියාකාරකම් සඳහා පොදු සහභාගිත්වය අත්‍යවශ්‍යයි” යනුවෙණි.

ඉදිරි වසර තුළ ප්‍රදර්ශන දෙකක් විවෘතකිරීමට MMCA ශ්‍රී ලංකා සැලසුම්කර ඇත. සන්දේවි හැන්ඩි හා ශාර්මිණී පෙරේයිරා අභිරක්ෂණයකරන මැයි මාසයේ මුල විවෘතවන 'ආගන්තුකයෝ' ප්‍රදර්ශනයේ, ඉමාද් මජීද් (b. 1989), නීනා මංගලනායගම් (b.1980), හා Musicmatters Collective වැනි කලාකරුවන් පිරිසකගේ සමකාලීන ශ්‍රී ලාංකික කලාකෘති එකතුවක් ප්‍රදර්ශනය වේ. ඉන්පසු, ශාර්මිණී පෙරේයිරා හා රිවෙල් මාසලින් අභිරක්ෂණයකරන, ශ්‍රී ලාංකික ගෘහ නිර්මාණ ශිල්පී මිනෙට් ද සිල්වා කේන්ද්‍රකරගත් ප්‍රදර්ශනයක් 2023 ඔක්තෝම්බර් මාසයේදී MMCA ශ්‍රී ලංකාහි විවෘතවනු ඇත.

MMCA ශ්‍රී ලංකා යනු සාමාන්‍ය ජනතාව, පාසල්, මෙන් ම සංචාරකයන්ගේ ද ප්‍රයෝජනය හා රසවින්දනය සඳහා නූතන සහ සමකාලීන කලා කෘති ප්‍රදර්ශනය, පර්යේෂණය, රැස්කිරීම, සහ සංරක්ෂණය වෙනුවෙන් කැප වූ පොදු කෞතුකාගාරයක් පිහිටුවීම අරමුණු කරගත් අධ්‍යාපනය පෙරටුකරගත් මුලපිරීමකි.